# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2023/32 - 2017 ජුනි මස 14 වැනි බදාදා - 2017.06.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78(xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශ මත, මෙම නියමය මගින් (2016 මාර්තු මස 9 වැනි දින අංක 1960/9 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් අවසන්වරට සංශෝධිත) එකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු වූ, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ පීඨ හා අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, 2007 ඔක්තෝබර් මස 09 වැනි දින අංක 1518/15 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ උපලේඛනයේ අංක I වන තීරයේ දැක්වෙන ''වෛද්‍ය පීඨය'' යන අයිතමයට අනුරූප වන්නා වූ උපලේඛනයේ II වන තීරයේ දැක්වෙන ''12. ඖෂධ විද්‍යා අධ්‍යයන අංශය'' යන සටහනට ඉක්බිතිවම පහත දැක්වෙන සටහන් ඇතුළත් කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''13. ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයන අංශය
14. පරපෝෂවේදී අධ්‍යයන අංශය''.

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2017 ජුනි මස 12 වැනි දින,
කොළඹ දී ය.

06-1023


1A - PG 3563 — 508 (2017/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*